# සන්නස

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandta Eeriyagama

**TAS**
Anura Seneviratne
03 6327 4259

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**අපේ ලිපිනය**
22 Lorne Street
Lalor Vic 3075 Australia
Tel/Fax : 03 9402 5380

## සංස්කාරක සටහන

සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. සන්සේ පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි සිංහල, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.



# ප්‍රභාකරන් තමන්ගේ දෙමළ ජනතාව මරාගෙන කනවා..

## ඩග්ලස් දේවානන්ද



*ඊ.පී.ඩී.පී. සංවිධානය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ සිටින එකම මන්ත්‍රීවරයා ඩග්ලස් දේවානන්ද මහතාය. කොටි සංවිධානයේ දැඩි තර්ජනයට ලක්වී සිටින ඊ.පී.ඩී.පී සංවිධානයේ නායක හා සමාජ සේවා හා සමාජ සුබ සාධන අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතා සමඟ වර්තමාන දේශපාලන හා යුද්ධමය තත්ත්වය පිළිබඳව කළ සාකච්ඡාවකි.*

***නැගෙනහිර පළාත කේන්ද්‍ර කරගෙන රජයේ හමුදාව මගින් කොටි සංවිධානයට විරුද්ධව දැවැන්ත මෙහෙයුමක් ආරම්භ කර තිබෙනවා. මේ ගැන ඊ.පී.ඩී.පී. සංවිධානයේ ස්ථාවරය කුමක්ද?***

කොටි සංවිධානය කියන්නේ තනිකරම පැසිස්ට්වාදී, ත්‍රස්තවාදී, ම්ලේච්ඡ සංවිධානයක්. එහි කිසිම මානුෂික ප්‍රජාතන්ත්‍රවාදී ගති ලක්‍ෂණයක් නැහැ. ඔවුන් විරුද්ධ වී සිටින්නේ සිංහල ජනතාවට පමණක් නොවේ. තමන්ගේම ජාතිය වන දෙමළ අයට විරුද්ධවත් ඔවුන් තිරිසන් විදියට වැඩ කටයුතු කරනවා.
කොටින්ම කියනවා නම්, දෙමළ ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් සටන් කරන බවට ලොකය ඉදිරියේ බොරු ප්‍රචාර ගෙන යන ප්‍රභාකරන්ගේ කොටි සංවිධානය අතින් වැඩියෙන්ම මැරුම් කා ඇත්තේ පීඩනයට ලක්වී ඇත්තේ අහිංසක දෙමළ ජනතාවයි. ඒක නිසා මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලුම ජනතාවට සාමයෙන් සතුටින්, නිදහසේ ජීවත්වීමට නම්, අනිවාර්යයෙන්ම ප්‍රභාකරන් ඇතුළු කොටි සංවිධානය විනාශ කළ යුතුයි. අපි මේ කතාව එදා පටන් කියන දෙයක් අද දවසේත් කියන්න තියෙන්නේ ඒ දේ තමයි.
මොකද ප්‍රභාකරන් හෝ ඔහුගේ සංවිධානය එදා අද කියලා ම්ලේච්ඡත්වයෙන් වෙනස් වෙලා නෑ. එදා වගේම අදත් ඔහු ඒ තිරිසන් වැඩපිළිවෙළ තමයි කරගෙන යන්නේ. එකේ කිසිඳු වෙනසක් නෑ. ඒක නිසා ප්‍රභාකරන්ව විනාශ කළ යුතුයි කියන තැනක තමයි අපි ඉන්නේ.
දැන් අර සමහර සතුන් ඉන්නවා තමන්ගේ පැටව් මරාගෙන කනවා. ප්‍රභාකරනුත් අන්න ඒ වගේ චරිතයක්. තමන්ගේම දෙමළ ජනතාව ඔහු මරාගෙන කනවා. ඉතින් එවැනි පුද්ගලයෙක් එවැනි සංවිධානයක් අපේ රටේ පැවැත්මට ඉතාමත් අහිතකරයි. එවැනි අය විනාශ කර දැම්මාට ප්‍රශ්නයක් නෑ. ඒකෙන් රටට සෙතක් සිදුවෙනවා මිසක් අහිතක් සිදුවන්නේ නෑ.
ඒ අතින් බලන කළ ප්‍රභාකරන්ට විරුද්ධව නැගෙනහිර ආරම්භ කර ඇති මෙහෙයුම අසාධාරණයි කියලා කියන්න බෑ. එහි මූලික පරමාර්ථය වන්නේ කොටි ත්‍රස්තවාදයෙන් දෙමළ ජනතාව මුදා ගැනීමයි. එය වියයුතු දෙයක්. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා සිය හමුදාව යොදා කරන්නේ ඒ දෙයයි. ඒකට අපේ කිසිඳු විරෝධයක් නෑ.

***ඔබ ප්‍රකාශ කරන ආකාරයට උතුර නැගෙනහිර අර්බුදයට එකම විසඳුම යුද්ධයද?***

නෑ. නෑ. මම එහෙම කියන්නේ නෑ. මේ ප්‍රශ්නය යුද්ධයෙන් පමණක් විසඳිය හැකි දෙයක් නොවේ. මේකට අනිවාර්යයෙන්ම දේශපාලන විසඳුමක් ඉදිරිපත් කළ යුතු වෙනවා.
මෙහිදී යුද්ධයත්, දේශපාලන විසඳුමත් යන කාරණා දෙකම එකට සිදුවිය යුතුයි. දෙකෙන් එකක්වත් පස්සට දමන්න බෑ. එහෙම නොවුණහොත් අපට යුද්ධයේවත්, සාමයේවත් යන දෙකෙන් එකක්වත් කෙළවරක් දකින්න ලැබෙන්නේ නෑ. මෙතනදී යුද්ධයත්, දේශපාලන විසඳුමත් යන දෙකම එකට සිදුවිය යුතුයි කියන කොට කිසියම් අයෙකුට ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවන්. මේ දෙකම කොහොමද එකට කරන්නේ කියලා. මම මෙතනදී අදහස් කළේ මේකයි. ප්‍රභාකරන් හෝ කොටි සංවිධානය කියන්නේ ත්‍රස්තවාදී කණ්ඩායමක්. ඔවුන්ව මූලික වශයෙන් යුද්ධයෙන් පරාජය කළ යුතුයි. නැත්නම් විනාශ කළ යුතුයි.
මොකද ප්‍රභාකරන්ගේ මිනීමරු පිළිවෙත අනිවාර්යයෙන්ම යුද්ධයෙන් පරාජය කිරීම යුගයේ අවශ්‍යතාවක් වෙලා. ඒ නිසා ඒකට යුදමය ක්‍රියා මාර්ගයක් ගැනීම වරදක් නෑ.

හැබැයි අනෙක් පැත්තෙන් ඒ එක්කම දෙමළ ජනතාවට දේශපාලන විසඳුමක් ඉදිරිපත් කර ඔවුන්ගේ ප්‍රශ්න විසඳිය යුතුයි. ඒ හරහා තමයි අපට ප්‍රභාකරන්ගේ මිනීමරු ප්‍රතිපත්තිය පරාජය කර දෙමළ ජනතාව දිනා ගැනීමට හැකිවන්නේ.

මම තවදුරටත් කියන්නේ අනිවාර්යයෙන්ම ප්‍රභාකරන් විනාශ කළ යුතුයි. ඔහු ජීවතුන් අතර සිටිනතුරු දෙමළ, මුස්ලිම්, සිංහල කිසිඳු ජන කොට්ඨාශයකට කිසිඳු සැනසුමක් නෑ.
හැබැයි, ඒ වගේම අපි දෙමළ ජනතාවගේ සාධාරණ ප්‍රශ්න විසඳා ඔවුන්ට නිදහසේ ජීවත්වීමට පුළුවන් ආකාරයට සියලුම දෙනාට පිළිගත හැකි දේශපාලන විසඳුමක් මේ සමඟම ඉදිරිපත් කළ යුතු වෙනවා.

**ශ්‍රීලාල් ප්‍රියන්ත**

***උතුරු නැගෙනහිර අර්බුදය විසඳීම උදෙසා ඔබ පක්ෂය ඉදිරිපත් කරන විසඳුම් යෝජනා වලිය කුමක්ද?***

මෙහෙමයි මේ ප්‍රශ්නය අපට තනියෙන් විසඳන්න පුළුවන් එකක් නොවේ. මේකට සියලුදෙනාගේම සහයෝගය ලබා ගත යුතුයි. උතුරේ දකුණේත් ජීවත් වන අයගේ එකඟතාව ලබාගත යුතු වෙනවා. එම කාර්යභාරය කිරීමේ මූලික වගකීම පැවරී ඇත්තේ ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මහතාට. ඔහු මේ සඳහා අවශ්‍ය පියවර ගත යුතුයි. විශේෂයෙන්ම පක්‍ෂයක් හැටියට අප මේ ප්‍රශ්නය විසඳීම උදෙසා රජයට මූලික කරුණු තුනකින් යුත් යෝජනාවලියක් ඉදිරිපත් කර තිබෙනවා. පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව සියලු දෙනාටම පිළිගන්න පුළුවන් වැඩපිළිවෙලක් තමයි අපි රජයට ඉදිරිපත් කර ඇත්තේ.

***මොකක්ද ඔබලා රජයට ඉදිරිපත් කර ඇති දේශපාලන යෝජනාවලිය.***

එක්සත් ශ්‍රී ලංකාවක් ඇතුළේ උපරිම බලය බෙදීමකින් පමණයි අපට මේ ප්‍රශ්නය විසඳිය හැක්කේ. එමගින් සියලු ජාතීන්ට ගෞරවණීය සාමයක් ඇතිවන ආකාරයට වැඩ කිරීමේ සාමකාමී පරිසරය උදා වෙනවා. ඒ බව අපේ යෝජනාවලිය තුළ පැහැදිලිව සඳහන් වෙනවා. විශේෂයෙන්ම පළාත් සභා ක්‍රමය මීට කදිම නිදසුනක්. මේ ක්‍රමය ශ්‍රී ලංකාවේ බහුතරයක් දෙනා පිළිගන්නවා. එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු බොහෝ ප්‍රධාන පක්‍ෂ අද පළාත් සභා ක්‍රමය තුළ සිය නියෝජනය තහවුරු කර තිබෙනවා. ඔවුන් ඒවා පිළිගන්නවා.
නමුත් මීට පෙර ශ්‍රී.ල.නි. පක්‍ෂය, ජ.වි.පෙරමුණ වැනි පක්‍ෂ මේ පළාත් සභා ක්‍රමයට විරුද්ධ වුණා. පාරට බැහැලා ඔවුන් මීට එරෙහිව උද්ඝෝෂණය කළා.. වහාම පළාත් සභා ක්‍රමය අහෝසි කළයුතු බවට හඬ නැඟුවා.

එහෙත් එදා පළාත් සභා ක්‍රමයට විරුද්ධව කෑකෝ ගසපු අය තමයි අද එය හොඳයි කියල ප්‍රමාද වී හෝ පිළිගෙන එම ක්‍රමය තුළ සිය නියෝජනය ඇති කර ක්‍රියා කරමින් සිටින්නේ.
ඉතින් අප මෙතැනදීත් රජයට ප්‍රකාශ කරන්නේ පළාත් සභා ක්‍රමය තුළ උපරිම බලය බෙදීමක් කිරීමෙන් පමණයි උතුරු නැගෙනහිර